# සුරකිමු ශක්තිය



මනීෂා සත්සරණී යසරත්න

ISBN 978-624-208-145-8

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛන අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.
2023.11.01

දරුණු භූමිකාම්පා හේතුවෙන්
වැලලී ගිය ශාක හා සතුන්
උෂ්ණත්වය, පීඩනය හේතුවෙන්
ගල් අඟුරු හා බොරතෙල් බවට පත්විය . . . . .
ඒවාගේ වාෂ්පශීලී අංශු මඟින්, ස්වභාවික වායුද
නිර්මාණය විය . . . . .
නමුත්,
තාක්ෂණික දියුණුව, මිනිස් අවශ්‍යතා අසීමිත වීම,
ජනගහනය වැඩිවීම, ආදී කරුණු හේතුවෙන් . . . . .
බලශක්තිය කෙරෙහි වූ ඉල්ලුම
දිනෙන් දින වැඩිවන්නට විය . . . . .
ඒ හේතුවෙන්ම ගල් අඟුරු, බොරතෙල් හා ස්වභාවික
වායුද සීග්‍රයෙන් අවසන් වෙමින් පවතින්නේය . . . . .
සදෙව්ලොවට අධිපති - ශක්‍ර දේවේන්ද්‍රයා විසින්
මනුලොව නර පනුවන් කෙරෙහි පතල වූ අනුකම්පාවෙන් . . . . .
බැල්ම හෙලන සඳ,
ශක්තිය අරපිරිමැස්මක් නොමැති කමින්,
භයානක ගැටලු රැසකට - මුහුණ දීමට සිදුවන බව දැන
මිනිස් වෙස්ගෙන - මනුලොවෙහි ශාන්තිකර්මයක් කිරීමට
තීරණය කරන ලද්දේ ය. . . . . (බෙරපද 4)

01. 2030 ලබන විටදී වායු වර්ග ඉවර වෙතේ
2050 ක් වන විට ඛනිජ තෙල් ද ඉවර වෙතේ
2080 ක් වන විට ගල් අඟුරු ද ඉවර වෙතේ
ආ. . . . . (බෙරපද 2)
මේක ඉතිං බලාගෙන ඉඳල හරියනවද?
නෑ. . . . . නෑ. . . . . නෑ. . . . . //
මොනවද කළයුතු එහෙනම්
(බෙරපද 2)

02. වැඩක් නැතිව දැල්වෙන අර - විදුලි බුබුළු නිවා දමව්
CFL LED ගෙන විදුලිය ඉතිරි කරව්
ආ. . . . . (බෙරපද 2)

03. දවල් කලට ජනෙල් ඇරල - හිරු එළියෙන් එළිය ලබව්
කෙනෙක් නැතිව කැරකෙන අර - විදුලි පංකා නතර කරව්
ආ. . . . . (බෙරපද 2)

04. ශිතකරණෙ දොර ඇරලා - උයන්නෙ මොනවද නොසිතා
උයන දෙයක් කලින් සිතා - විවර කරව් දොර සැමදා
ආ. . . . . (බෙරපද 2)

05. බෙහෙත් ගහපු වස එළවළු - ශිතකරණෙ පුරවාගෙන
විදුලිය වැය කර නොමරැක - ගේ වටේට වවපල්ලා . . . . .
ආ. . . . . (බෙරපද 2

06. අක්ක නංගි අයිය මල්ලි - හැමවෙලේම රංඩු නොවී
එක මේසෙක වටවීලා - පාඩම් වැඩ කරපල්ලා . . . . .
ආ. . . . .  (බෙරපද 2)

07. ගෑස් ලිපෙන් උයන සැවොම - මේ ගැන තව හිතපල්ලා
නිතරම එය පිරිසිදු කර - නිල් දැල්ලක් අරගල්ලා . . . . .
ආ. . . . .  (බෙරපද 2)

08. පිසිනා විටදී ආහාර - හානි නොවන ලෙස තාපය
අනගි උඳුන භාවිතයෙන් - දර ටික තව රැකගල්ලා . . . . .
ආ. . . . .  (බෙරපද 2)

09. තම්බාගන්නා විටදී - අල ගෙඩියක් කඩල ටිකක්
වැසෙන පමණ වතුර දමා - සැමවිට තම්බාපල්ලා . . . . .
වතුර වැඩිය දැම්මෝතින් - ඉන්ධන අපතේ යනවා
ආ. . . . .  (බෙරපද 2)

10. කැරට් අලද වට්ටක්කා - රටදෙල් හා මඤ්ඤොක්කා
තම්බා ගන්නා විටදී - කුඩා කෑලි කපපල්ලා . . . . .
එහෙම උනොත් ගෑස්, දරද විදුලිය තව ඉතිරි වෙනා . . . . .
ආ. . . . .  (බෙරපද 2)

11. පංති යන්ට ගමන් යන්ට - සැමවිට රෙදි නොමදිල්ලා

ගෙදර සැවොම එකම විටදි - රෙදිටික මැදලා ගල්ලා . . . .

ආ. . . . . (බෙරපද 2)

12. කාන්දු වන ජල කරාම - වතුර ටැංකි දුටු විටදී

ඉක්මනින්ම පිලියම් කර - ජල සම්පත රැකපල්ලා

වතුර පොම්ප කරන්න යන - ශක්තිය ගැන සිතපල්ලා . . . .

ආ. . . . . (බෙරපද 2)

13. රූප පෙට්ටියක් අලුතින් - ගෙනෙනා විට නුඹ ගෙදරට

LED යෙදූ ඒවා - හැමවිට තෝරා ගල්ලා. . . . .

ආ. . . . . (බෙරපද 3)

14. තනි තනියෙන් සැප සොයනා - සැප වාහන අඩු කරලා

විධිමත් පොදු ප්‍රවාහනය - දියුණු කරල ඉතිරි කරව්

එහෙම නැතත් ඇඟට හොඳයි - ළඟට පයින් පලයල්ලා . .

ආ. . . . . (බෙරපද 3)

15. තරුණ දරුවො මෙහ ඇවිදින් - මේ ගැන අහගෙන මැනවින්

ගෙයක් හදන විට ඉදිරියෙ - හොඳ සැලසුම් හදපල්ලා . . .

ආ. . . . . (බෙරපද 2)

16. මැටි ගඩොලින් බිත්ති බැඳල - ගැලපෙන ලෙස වැඩිම උසක්

උළු යොදලා සෙවිලි කරල - දැව සීලිම ගහපල්ලා . . . . .

ආ. . . . . (බෙරපද 2)

17. වහලෙ සෙවිලි කරන විටදි - වීදුරු උළු එක්කරලා

කුස්සියෙ දුම් කවුළු වලට - වීදුරු ගල් යොදපල්ලා . . . . .

ආ. . . . . (බෙරපද 2)

18. බිත්ති වලට යෙදුවෝතින් - ඉතාම ලා පැහැති වර්ණ

වොට් අගයෙන් අඩු වූ බල්බ - යෙදුමට හැකිවෙයි නුඹලට

එමෙන්ම ලා පැහැති වර්ණ - ගෙනදෙයි මනසට සහනය . .

ආ. . . . . (බෙරපද 2)

19. ජනෙල් වලට ගෝණි වගේ - ඝන තිර රෙදි නොදමල්ලා

හිරු එළියක් හොඳට ලැබෙන - වීදුරු තව යොදපල්ලා . . .

ආ. . . . . (බෙරපද 3)

20. බෝ නොවෙනා සියළු රෝග - නිවාරණය කරගන්නට

කය වෙහෙසා වැඩ කරලා - ශක්තිය තව රැකපල්ලා . . . .

ආ. . . . . (බෙරපද 4)

## ස්තූතියි.

මා ඉගෙනුම ලබන මහාමායා බාලිකා විදුනි මවුනි ඔබටත් අපිව නිතරම දිරිමත් කරමින් මඟ පෙන්වන වත්මන් විදුහල්පති තුමිය ශශිකලා සේනාධීර මැතිණියටත්, නියෝජ්‍ය සහකාර විදුහල්පතිතුමියන්ලා ඇතුළු ඇඳුරු මඩුල්ලටත්, ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ලෙස මෙය එලි කිරීමට දිරි ගැන්වූ සෙනෙවිරත්න මහලේකම් ගුරු පියාණන්ටත් තුති පුදමි.

එසේම මෙය ලිවීමේ දී මට මඟ පෙන්වූ විද්‍යා ගුරුතුමියක් වන මාගේ මෑණියන් හා නිබඳවම මට දිරි දෙන පියාණන් ගෞරවයෙන් සිහිපත් කරමි.

මනීෂා සත්සරණී යසරත්න

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට,<br>
සෙනෙවිරත්න මහලේකම්<br>
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක<br>
2023.11.01